<u>මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ස්ථානභාර නිළධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි සංශෝධන 01</u>

<table>
<tr><th>ඡේද අංකය</th><th>දැනට තිබෙන පිළිවෙල</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th><th>සංශෝධනය කිරීමට හේතුව</th></tr>
<tr><td>6.1</td><td>• ළමා නිවාසය/රැඳවුම් නිවාසයේ තාක්ෂණික විධිවිධාන හා පරිපාලන කටයුතු මෙහෙයවීම.<br>• ස්ථාවර නියෝගවලට අදාළ පරිපාලන සහ මූල්‍ය කටයුතු</td><td>6.1</td><td>• පළාත් ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ/රැඳවුම් නිවාසයේ තාක්ෂණික විධිවිධාන හා පරිපාලන කටයුතු මෙහෙය වීම.<br>• ස්ථාවර නියෝග වලට හා චක්‍රලේඛ වලට අනුව පරිපාලන සහ මූල්‍ය කටයුතු<br><br>පරිපාටියේ දැක්වෙන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණුද ඇතුලත් විය යුතුය.<br>• ආයතනයේ පරිපාලනය විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පොත්පත් හා ලේඛණ විධිමත්ව හා දෛනිකව පවත්වා ගෙන යාම.<br>• තම කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙනුවෙන් රාජකාරි චක්‍රයක් පවත්වා ගෙන යාම.</td><td>දැනට තිබෙන කාර්යයන්ට අමතරව මෙම කරුණුද ඇතුලත් විය යුතුය.</td></tr>
<tr><td>7.1</td><td>බඳවා ගන්නා ප්‍රතිශතයන්:<table><tr><td>ධාරාව</td><td>ප්‍රතිශතය</td></tr><tr><td>විවෘත</td><td>100%</td></tr><tr><td>සීමිත</td><td>අදාළ නොවේ.</td></tr><tr><td>කුසලතා</td><td>අදාළ නොවේ.</td></tr></table></td><td>7.1</td><td>බඳවා ගන්නා ප්‍රතිශතයන්:<table><tr><td>ධාරාව</td><td>ප්‍රතිශතය</td></tr><tr><td>විවෘත</td><td>25%</td></tr><tr><td>සීමිත</td><td>75%</td></tr><tr><td>කුසලතා</td><td>අදාළ නොවේ.</td></tr></table>(සීමිත පදනම මත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථා වලදී පමණක්එම අවස්ථාවේ පවතින පුරප්පාඩු විවෘත පදනමින් පුරවනු ලැබේ)</td><td></td></tr>
<tr><td>7.2<br><br>7.2.2.1</td><td>විවෘත බඳවා ගැනීම<br><br>අධ්‍යාපන සුදුසුකම්:<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.</td><td>7.2<br><br>7.2.2.1</td><td>විවෘත බඳවා ගැනීම<br><br>අධ්‍යාපන සුදුසුකම්:<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ මනෝ විද්‍යාව හෝ නීතිය හෝ සමාජ වැඩ පිළිබඳ හෝ පරිපාලනය හෝ කළමනාකරණය යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම</td><td>තනතුරට පැවරෙන රාජකාරි ඉටු කිරීම සඳහා වඩාත් සුදුසුම පුද්ගලයන් තෝරා ගැනීම.</td></tr>
<tr><td>7.2.4.4<br><br>7.2.4.4.1</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (ඇමුණුම 01)<br><br>සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :-<br>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</td><td>7.2.4.4<br><br>7.2.4.4.1</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (ඇමුණුම 01)<br><br>සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :- මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව මධ්‍යම පළාත් සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශ ලේකම්</td><td>දැනට පරිපාටියේ (ඇමුණුම 01 ඉවත්කර නව (ඇමුණුම 01 ඇතුලත් කිරීම</td></tr>
<tr><td>7.3</td><td><u>සීමිත බඳවා ගැනීම</u>. :- අදාළ නොවේ.</td><td>7.3<br><br>7.3.1<br><br>7.3.2</td><td><u>සීමිත බඳවා ගැනීම</u><br><br>බඳවා ගන්නා ශ්‍රේණිය:- III ශ්‍රේණිය<br><br>සුදුසුකම්</td><td></td></tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-05-30 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

<table>
<tr><td></td><td></td><td>7.3.2.1</td><td>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:-<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව හෝ මනෝ විද්‍යාව හෝ නීතිය හෝ සමාජ වැඩ පිළිබඳ හෝ පරිපාලනය හෝ කළමනාකරණය යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම<br>සහ<br>මධ්‍යම පළාත් සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත MN-01 හෝ ඊට ඉහළ තනතුරක අවම වශයෙන් වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිතව සේවයේ ස්ථිර කර තිබීම, පූර්වාසන්න වසර 05 ක කාලසීමාව තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම සහ එම කාලසීමාව තුල විනයානුකූල දඬුවමක් ලබා නොතිබිම.</td><td>අභ්‍යන්තර අයදුම්කරුව න් සඳහා අවස්ථාව ලබා දීමට</td></tr>
<tr><td></td><td></td><td>7.3.2.3.</td><td>පළපුරුද්ද :- අදාල නොවේ.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.3.1</td><td>අවම වයස් සීමාව :- අවු:21 ට නොඅඩු</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.3.2</td><td>උපරිම වයස් සීමාව:- අදාළ නොවේ.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4.1</td><td>ලිඛිත විභාගය :- අදාල නොවේ.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4.2</td><td>වෘත්තීය පරීක්ෂණය :- අදාල නොවේ.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4.3.</td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:- අදාල නොවේ.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4.4.</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:- (ඇමුණුම 01)<br>ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු:-<br>තනතුරට පැවරෙන රාජකාරි ඉටුකිරීම සඳහා වඩාත් සුදුසුම පුද්ගලයන් තෝරා ගැනීම.</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.4.4.1</td><td>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා:- මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව මධ්‍යම පළාත් සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශ ලේකම්</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.3.5</td><td>අයදුම්පත් කැඳවීමේ ක්‍රමය:- මධ්‍යම පළාත් සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින්</td><td></td></tr>
<tr><td></td><td></td><td>7.4</td><td>කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ</td><td></td></tr>
<tr><td>9</td><td>භාෂා ප්‍රවීණතාව :<br><table><tr><th>භාෂාව</th><th>ලබාගත යුතු ප්‍රවීණතාවය</th></tr><tr><td>01.රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.</td></tr><tr><td>02.අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා කලින් කලට ඒ සඳහා කෙරෙන සංශෝධන අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුවඅදාළ , මට්ටමේ භාෂාප්‍රවීණතාව ලබා ගත යුතුය.</td></tr></table></td><td>9</td><td>භාෂා ප්‍රවීණතාව :<br><table><tr><th>භාෂාව</th><th>ලබාගත යුතු ප්‍රවීණතාවය</th></tr><tr><td>01.රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.</td></tr><tr><td>02.අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා කලින් කලට ඒ සඳහා කෙරෙන සංශෝධන අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ භාෂා ,ප්‍රවීණතාව ලබා ගත යුතුය.</td></tr></table></td><td>නව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධාන ඇතුළත් කිරීම</td></tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 05 - 30 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 01

පරීක්ෂණයේ නම:- මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ස්ථානභාර නිළධාරි තනතුර සඳහා (සීමිත/විවෘත) අයදුම්කරුවන් බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබාදෙනු ලබන විෂය ක්ෂේත්‍රය | කාණ්ඩ ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 55 | 40%<br>ඉහලම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. |
| i. පූර්ව ළමාවිය /ළමා සංවර්ධනය විෂයන් සහිතව සහතික පත්‍ර පාඨමාලා සහතිකය (තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත්) | 10 | | |
| ii. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය/ ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් ලබා ඇති සමාජ වැඩ පිළිබඳ වර්ෂ දෙකක ඩිප්ලෝමාව | 10 | | |
| iii. පශ්චාත් උපාධිය (තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් සමාජ විද්‍යාව /මනෝ විද්‍යාව /සමාජ වැඩ /මානව විද්‍යාව/ අපරාධ විද්‍යාව / නීතිය/ සාමය හා ගැටුම් කළමනාකරණය උපදේශණය යන විෂයන් සහිතව) | 25 | | |
| iv. අයදුම්කරුගේ ආගමට අදාළ දහම් පාසල් අවසාන සහතිකය | 10 | | |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | | | |
| i. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක ළමා සංවර්ධනය, පෝෂණය, ප්‍රථමාධාර වැනි ළමුන්ට අදාළ ක්ෂේත්‍රයක මාස 06ට නොඅඩුව ලබා ඇති ප්‍රවීණතාවය | 10 | 20 | |
| ii. භාෂා ප්‍රවීණතාවය ( ඉංග්‍රීසි ) අ.පො.ස. (සා/පෙළ) සාමාන්‍ය සාමර්ථය හෝ තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් පාඨමාලා සහතිකය) | 05 | | |
| iii. පරිගණක දැනුම ( තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත් පාඨමාලා සහතිකය) | 05 | | |
| 3. විෂය බාහිර ක්‍රියාකාරකම්<br>ක්‍රීඩා /නායකත්ව/සමාජ සුභ සාධන කටයුතු /කලා කටයුතු ආදි<br>පාසල් මට්ටම - ලකුණු 3<br>කළාප මට්ටම - ලකුණු 5<br>පළාත් මට්ටම - ලකුණු 10<br>ජාතික මට්ටම - ලකුණු 15<br>ජාත්‍යන්තර මට්ටම - ලකුණු 20 | 20 | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතාවය | 05 | 05 | |
| මුළු ලකුණු ප්‍රමාණය | | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-05-30 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

03.පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්

04.පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇති වූ විට

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු.

01. ඩබ්.එම්.එම්.ජී. අබේසිංහ බණ්ඩා මහතා (සභාපති) ..............................

02. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................

03. සී.පී.එස්. ඉලංගසිංහ මහතා (සාමාජික) ..............................

04. ටී.බී.එම්.එස්.ඩී. තෝරදෙණිය මහත්මිය (සාමාජික) ..............................

05. ජී.එල්.ජී. තිස්ස ජී. මාරහෙල මහතා (සාමාජික) ..............................

දිනය :- 2025/05/20

ආණ්ඩුකාර ලේකම්,

2025/05/20 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2025/773 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ස්ථානභාර නිළධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි සංශෝධනය අංක - 01 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2025/05/20

..............................
ලේකම් (වැ.බ),
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / ~~අනුමත නොකරමි.~~

20/05/25

සරත් බී.එස්. අභයකෝන්
(BScEng, M.A.Sc., Ph.D, CEng, IntPE, FIESL, FNASSL)
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාල